AL/2016/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| **බෞද්ධ ශිෂ්ටාචාරය I**<br>பௌத்த நாகரிகம் I<br>Buddhist Civilization I | **45 S I** | **පැය දෙකයි**<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** මහා බ්‍රහ්මයා විසින් වර්ණ භේදයක් සහිත ව මනුෂ්‍ය වර්ගයා මවන ලදැයි වෛදික සාහිත්‍යයෙහි දැක්වේ. එහිලා චතුර්වර්ණය මැවීමේ පදනම ලෙස සලකා ඇත්තේ,
(1) ගුණ කර්ම විභාගයයි. (2) නියතිවාදයයි. (3) පරිණාමවාදයයි.
(4) හේතුඵලවාදයයි. (5) අහේතු අප්‍රත්‍යයවාදයයි.

**2.** වෛදික සාහිත්‍යයට අනුව බ්‍රාහ්මණ වර්ණයට අයත් **නොවන** ස්වධර්මය ඇතුළත් වනුයේ මින් කුමන වරණයෙහි ද?
(1) අධ්‍යාපනය, යාග කිරීම, යාග කරවීම
(2) අධ්‍යාපනය, දන්දීම, රාජ්‍යානුශාසනය
(3) අධ්‍යාපනය, අධ්‍යයනය, යාග කිරීම
(4) අධ්‍යාපනය, යාග කිරීම, කෘෂිකර්මාන්තය
(5) අධ්‍යාපනය, යාග කරවීම, රාජ්‍යානුශාසනය

**3.** බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව විවිධ නීති රීති මගින් කාන්තා නිදහස පාලනය කළ බව මූලාශ්‍රයාගත තොරතුරුවලින් පැහැදිලි වේ. ඒ අනුව බිරිඳ දිවි හිමියෙන් බොහෝ යුතුකම් හා චාරිත්‍ර ඉටු කරමින් සිය ස්වාමි පුරුෂයා ගෞරවණීය ලෙස තෘප්තිමත් කළ යුතු විය. බ්‍රාහ්මණ චාරිත්‍ර වාරිත්‍රවලට අනුව බිරිඳ විසින් ස්වාමි පුරුෂයා වෙනුවෙන් දැක්විය යුතු උසස්ම ගෞරවය ලෙස සලකා ඇත්තේ,
(1) ස්වාමි පුරුෂයාගේ දෙමවුපියන් හොඳින් රැකබලා ගැනීමයි.
(2) දරුවන්ගේ හා නිවසේ කටයුතු සියල්ල මැනවින් ඉටු කිරීමයි.
(3) ස්වාමි පුරුෂයාට නො අඩුව සිය සිතැඟි ඉටු කර ගැනීමට ඉඩ දීමයි.
(4) ස්වාමි පුරුෂයා මියගිය පසු වැඩිමහල් පුත්‍ර යටතේ අවිවාහක ජීවිතයක් ගත කිරීමයි.
(5) ස්වාමි පුරුෂයා මළ පසු සති පූජාව පැවැත්වීමයි.

**4.** "බොහෝ සත්ත්වයන්ට අහිත පිණිස, දුක් පිණිස, ව්‍යසනය පිණිස හේතුවන මිනිස් කෙමනක් "ලෙස බුදුරජාණන් වහන්සේගේ විවේචනයට ලක් වූ බුද්ධකාලීන භාරතීය ප්‍රකට ශාස්තෘවරයා වූයේ,
(1) පූරණ කස්සප ය. (2) මක්ඛලී ගෝසාල ය. (3) අජිත කේසකම්බල ය.
(4) පකුධ කච්චායන ය. (5) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.

**5.** ක්‍රි.පූ. හයවන සියවසේ භාරතයේ ක්‍රියාත්මක ව පැවති ආගමික හා දාර්ශනික ඉගැන්වීම් ප්‍රධාන වශයෙන් බ්‍රාහ්මණ හා ශ්‍රමණ යන දෙකොටසට ඇතුළත් කළ හැකිය. ශ්‍රැතිය, පිටක සම්ප්‍රදාය, විශ්වාසය පදනම් කරගත් කර්ම මාර්ගයට අනුගත බ්‍රාහ්මණික ඉගැන්වීම් ශ්‍රමණයන්ගේ නිබඳ විවේචනයට ලක්විය. එසේ වුව ද බමුණන් විසින් දැඩිව විශ්වාසය තැබූ එක් පිළිගැනීමක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) ලෝකායතවාදයයි. (2) හේතුඵලවාදයයි. (3) පුබ්බේකතහේතුවාදයයි.
(4) නියතිවාදයයි. (5) ඊශ්වරනිර්මාණවාදයයි.

**6.** බුද්ධකාලීන භාරතයේ පැවති සොළොස් මහා ජනපද අතර ගණතන්ත්‍ර පාලනය ක්‍රියාත්මක වූ ජනපද දෙකක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) වජ්ජි හා මගධ රාජ්‍යයන් ය. (2) වජ්ජි හා කෝසල රාජ්‍යයන් ය.
(3) වජ්ජි හා මල්ල රාජ්‍යයන් ය. (4) වජ්ජි හා කාසි රාජ්‍යයන් ය.
(5) වජ්ජි හා අවන්ති රාජ්‍යයන් ය.

[දෙවැනි පිටුව බලන්න.

**7.** හේතුඵලවාදී මූලධර්ම මත පදනම් ව සමාජය ක්‍රමික ව පරිණාමය වූ බව බෞද්ධ ඉගැන්වීමයි. මෙකී සන්දර්භය තුළ ආර්ථික, දේශපාලන, ආගමික හා ගෘහස්ථ සමාජ සංස්ථා ප්‍රභවය වූයේ,
(1) පුද්ගල ස්වාධීනත්වය තහවුරු කර ගැනීමට දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) පුද්ගලාන්තර සම්බන්ධතා ගිලිහී ගිය හෙයිනි.
(3) පුද්ගලයාගේ අත්තනෝමතික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙනි.
(4) පුද්ගලයා සිය ගැටලුවලට විසඳුම් සෙවීමට යාමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) නිර්මාණවාදී සංකල්ප බැහැර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

**8.** බෞද්ධ ඉගැන්වීම්වල සුලභව හමුවන අත්තකාර, පරකාර, ආරම්භ ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු ආදී පාරිභාෂික පදවලින් පුද්ගලයාගේ,
(1) වගකීම අවධාරණය කරනු ලැබේ.
(2) චරිත ලක්ෂණ අවධාරණය කරනු ලැබේ.
(3) යුතුකම් අවධාරණය කරනු ලැබේ.
(4) සදාචාරය අවධාරණය කරනු ලැබේ.
(5) ශක්තිය අවධාරණය කරනු ලැබේ.

**9.** ක්‍රි.පූ. හයවැනි සියවසේ භාරතයෙහි විවිධ දර්ශනවාද ව්‍යාප්ත ව පැවතුණි. ඊශ්වර නිර්මාණවාදය, නියතිවාදය, පුබ්බේකතහේතුවාදය, අධිච්චසමුප්පන්නවාදය ඒ අතර ප්‍රමුඛ වේ. මෙම ඉගැන්වීම් වලින් මූලික වශයෙන් පුද්ගලයාගේ ස්වාධීනත්වය හා වගකීම
(1) අර්ථවත් කෙරේ.
(2) දුර්වල කෙරේ.
(3) පුද්ගලයාට ම පැවරේ.
(4) විවරණය කෙරේ.
(5) කෙරෙහි කිසිදු බලපෑමක් සිදු නො කෙරේ.

**10.** බෞද්ධ පාලකයා සිය පාලන තන්ත්‍රය තුළ "අධාර්මික ක්‍රියාවන්ට ඉඩ නො තැබිය යුතුය" යන්න ප්‍රමුඛත ම බෞද්ධ දේශපාලන සිද්ධාන්තයකි. මෙම ඉගැන්වීම් ඇතුළත් බෞද්ධ දේශපාලන මූලධර්මය වනුයේ,
(1) සතර අගතියයි.
(2) පඤ්චසීලයයි.
(3) සප්ත අපරිහානිය ධර්මයයි.
(4) දශරාජ ධර්මයයි.
(5) දස සක්විති වතයි.

**11.** රටක සාම්ප්‍රදායික ලක්ෂණ බැහැර නොකොට ඒවා රැක ගැනීම ජන සම්මතවාදී පාලන තන්ත්‍රයක පැවතිය යුතු සුවිශේෂ ලක්ෂණයකි. එවැනි පාලන තන්ත්‍රයකට අනුබල දෙන ප්‍රකට බෞද්ධ දේශපාලන සිද්ධාන්තයක් ඇතුළත් මූලාශ්‍රය වනුයේ,
(1) කූටදන්ත සූත්‍රයයි.
(2) චක්කවත්ති සීහනාද සූත්‍රයයි.
(3) ජාතක පාළියයි.
(4) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(5) මහා පරිනිබ්බාණ සූත්‍රයයි.

**12.** භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යනු බුදුසසුනෙහි දැක්වෙන චතුර්විධ ශ්‍රාවක පිරිසයි. ගිහි පැවිදි දෙපක්ෂයේ ම බුදුරදුන්ගේ ශ්‍රාවකයෝ සිටිති. ආර්ය ශ්‍රාවක යනුවෙන් හැඳින්වෙන්නේ ද විශේෂිත වූ බුද්ධ ශ්‍රාවක පිරිසකි. බෞද්ධ ඉගැන්වීම් අනුව ආර්ය ශ්‍රාවකයෝ,
(1) භික්ෂු-භික්ෂුණී පිරිස අතර පමණක් සිටිය හැකිය.
(2) උපාසක-උපාසිකා පිරිස අතර පමණක් සිටිය හැකිය.
(3) සිවුවණක් පිරිසෙහි ම සිටිය හැකිය.
(4) රහත් ඵලයට පත් ශ්‍රාවකයන් අතර පමණක් සිටිය හැකිය.
(5) මාර්ගඵලවලට නො පත් ශ්‍රාවකයන් අතර පමණක් සිටිය හැකිය.

**13.** සිගාලෝවාද සූත්‍රාගත යුතුකම් හා වගකීම් අනුව පළමු ව අවදිවීමත්, පසුව නින්දට යාමත්,
(1) සේවකයන්ගේ යුතුකමකි.
(2) දරුවන්ගේ යුතුකමකි.
(3) බිරිඳගේ යුතුකමකි.
(4) ශිෂ්‍යයන්ගේ යුතුකමකි.
(5) දෙගුරුන්ගේ යුතුකමකි.

**14.** "මිනිසකුට තබා කුහුඹුවෙකුටවත් හිංසා පීඩා නොකරන සැබෑ බෞද්ධයා, කිසිදු හේතුවක් නිසා අන්සතු වස්තුව පිළිබඳ ලෝභ සිතිවිල්ලක් පවා උපදවා නොගනියි. රටේ නීතියට මෙන් ම සමාජ සදාචාරයට ද ගරු කරන ඔහු සදාචාරමය සීමාව තුළ කාමභෝගී වූත්, තෘප්තිමත් වූත් නිරවුල් විවාහ දිවියක සුව විඳියි. පවුලේ මෙන් ම සමාජයේ සාමය හා සහජීවනය අගය කරන හෙතෙම සියලු දෙනාගේ විශ්වාසය දිනා සත්‍යවාදී ව ජීවත් වෙයි. ඔහු කාමභෝගී ව කටයුතු කළ ද කාමයෙන් හෝ සුරාවෙන් හෝ අන්කිසිවකින් මුසපත් ව, අගතිගාමී ව කටයුතු නොකරයි." සමස්ත ඡේදයට අනුව පැහැදිලි වන්නේ සැබෑ බෞද්ධයා,
(1) රටේ නීතියට හා සමාජ සදාචාරයට ගරු කරමින් ජීවත්වන බව ය.
(2) කාමයෙන් මුසපත් ව කටයුතු නො කරන බව ය.
(3) පන්සිල් සුරකින බව ය.
(4) සාර්ථක විවාහ දිවියක් ගත කරන බව ය.
(5) සතර අගතියෙන් වැළකී කටයුතු කරන බව ය.

**15.** "සියලු සත්ත්වයෝ ම දඬුවමට, මරණයට අකමැති ය. බිය ය. ජීවත්වීමට කැමති ය. දුක පිළිකුල් කරන අතර සැප කැමති ය. එහෙයින් තමා පිළිබඳ කල්පනා කොට අනුන් නො පෙළිය යුතුය. නො නැසිය යුතුය." මෙම බෞද්ධ ඉගැන්වීම හඳුන්වන්නේ,
(1) අත්තුක්කංසන ධර්ම පර්යාය යනුවෙනි. (2) අත්තූපනායික ධර්ම පර්යාය යනුවෙනි.
(3) අත්තාධිපති ධර්ම පර්යාය යනුවෙනි. (4) අත්තුද්දේසික ධර්ම පර්යාය යනුවෙනි.
(5) අත්තුපක්කම ධර්ම පර්යාය යනුවෙනි.

**16.** දස කුසලයන්හි යෙදීම යනු කායිකව, වාචසිකව හා මානසිකව සිදු කරනු ලබන දශවිධ අකුසලයෙන් වෙන් ව කටයුතු කිරීමයි. දස අකුසලයෙන් වෙන් ව කටයුතු කිරීමේ දී කායික හා වාචසික සංවරය පිණිස අකුසල්,
(1) තුනකින් වෙන් විය යුතු ය. (2) හතරකින් වෙන් විය යුතු ය.
(3) පහකින් වෙන් විය යුතු ය. (4) හයකින් වෙන් විය යුතු ය.
(5) හතකින් වෙන් විය යුතු ය.

**17.** ගමේ අවමංගල්‍යාධාර සමිතිය ධර්ම දේශනා පිංකමක් සංවිධානය කළේ මියගිය සිය සාමාජිකයන්ට පිං පැමිණවීම පිණිසයි. තරුණ පිරිස හේවිසි නාද මැද ධර්ම දේශකයන් වහන්සේ වැඩමවා ගත්තේ මහත් ගෞරවයෙනි. අනතුරුව පා ධෝවනය ආදී වතාවත් කොට, උන්වහන්සේ විෂයයෙහි දැක්විය යුතු ගරු බුහුමන් වන්දනාමාන පවත්වා දැහැත් ගිලන්පස පිළිගන්වන ලදී. තිසරණ පංච ශීල සමාදානයෙන් පසු දශ පුණ්‍යක්‍රියා පිළිබඳ ව පවත්වන ලද උන්වහන්සේගේ සාරවත් දෙසුම සියල්ලෝම කර්මඵල විශ්වාස කිරීමේ සම්‍යග්දෘෂ්ටියෙන් ශ්‍රවණය කළ හ. අවසානයේ දහම් පඬුරු පුදා, පැන් වඩා මියගිය සාමාජිකයන්ට පිං පැමිණ වූ සැදැහැතියෝ සාදු සාදු යැයි තමන් ද පිං අනුමෝදන් ව පිංකම හමාර කළහ. මෙම ඡේදයට අනුව ධර්ම දේශනා පිංකමට සහභාගී වූ සැදැහැතියෝ දස පුණ්‍යක්‍රියා වලින්,
(1) හයක් සිදු කළහ. (2) හතක් සිදු කළහ. (3) අටක් සිදු කළහ.
(4) නවයක් සිදු කළහ. (5) දහය ම සිදු කළහ.

**18.** අධිපති ධර්ම හෙවත් ආධිපතෙය්‍ය ධර්ම යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) විහාරස්ථාන පරිපාලනය පිළිබඳ සිද්ධාන්තයකි.
(2) රාජ්‍ය පාලනය පිළිබඳ සිද්ධාන්තයකි.
(3) නිර්වාණගාමී මාර්ගය පිළිබඳ සිද්ධාන්තයකි.
(4) ගෘහපාලනය පිළිබඳ සිද්ධාන්තයකි.
(5) සදාචාරමය නිර්ණායක පිළිබඳ සිද්ධාන්තයකි.

**19.** 'ආකාරවතී' යන පාරිභාෂික වචනය,
(1) ඉල්පෙන ශ්‍රද්ධාව පැහැදිලි කිරීමට භාවිත කෙරේ.
(2) භක්තිමත් භාවය පැහැදිලි කිරීමට භාවිත කෙරේ.
(3) දැඩිව ග්‍රහණය කිරීම පැහැදිලි කිරීමට භාවිත කෙරේ.
(4) අවබෝධයෙන් යුතු පැහැදීම ගෙනහැර දැක්වීමට භාවිත කෙරේ.
(5) නිරවද්‍යතාව පැහැදිලි කිරීමට භාවිත කෙරේ.

**20.** කහවනු වැස්සකින් වුව ද තෘප්තිමත් නොවන මිනිසා තණ්හාවට දාසයෙක් වෙයි. ඔහුට සැමදා ජීවිතයේ අඩුවක් පවතී. එහෙයින් රජවරු ද අනෙක් බොහෝ මිනිස්සු ද තණ්හාව ක්ෂය නො කොට, අසන්තෘප්ත මනසින් සිරුර අත්හරිති. කාමය වනාහි මිනිසාට තෘප්තියකින් අවසන් කළ නො හැක්කකි. එහෙයින් ආශාවන් නොව අවශ්‍යතා සම්පූර්ණ කර ගත යුතුව ඇතැයි බුදු සමය උගන්වයි. එහෙත් කාමභෝගී ගිහියන් විසින් භෞතික සම්පත් පරිහරණය කිරීම සහ කම්සුව විඳීම වරදක් නො වේ. ගෘහස්ථ ප්‍රතිපදාව තුළ මෙම විසංවාදී තත්ත්වයන් සමනය කොට සාර්ථක ජීවිතයක් පවත්වාගෙන යාම පිණිස,
(1) අල්පේච්ඡතාව ප්‍රගුණ කළ යුතු ය.
(2) සම්පත් ඉපයීම හා පරිභෝජනය සීමා කළ යුතු ය.
(3) හැකිතරම් පරිත්‍යාගශීලී ව කටයුතු කළ යුතු ය.
(4) භෞතික සම්පත් අත්හැර නිර්වාණගාමී මාර්ගයේ නියැලිය යුතු ය.
(5) කම්සුව විඳීමෙන් වැළකිය යුතු ය.

**21.** ව්‍යග්ඝපජ්ජ සූත්‍රාගත ඉගැන්වීම් අනුව 'භෝග සුඛ' යන්න පැහැදිලි කිරීමට වඩාත් සුදුසු ප්‍රකාශය වන්නේ,
(1) උපයාගත් බොහෝ භෝග සම්පත් ඇතැයි ලබන සතුටයි.
(2) දැහැමෙන් සෙමෙන් උපයාගත් භෝග සම්පත් ඇතැයි ලබන සතුටයි.
(3) ණය නැතිව උපයාගත් බොහෝ භෝග සම්පත් ඇතැයි ලබන සතුටයි.
(4) භෝග සම්පත් පරාර්ථය පිණිස ම කැප කිරීමෙන් ලබන සතුටයි.
(5) උපයාගත් ධනය මැනවින් පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.

**22.** දිළිඳුකම වනාහි කාමභෝගී ගිහියාට දුකකි. ධාර්මික ව උපයාගත් ධන සම්පත් පුද්ගලයකු සතුවීම සැපතක් ලෙස බුදුසමය පිළිගනියි. ගෘහස්ථ ජීවිතයේ සාර්ථකත්වය පිණිස ආර්ථික සමෘද්ධිය පමණක් නොව ආර්ථික සුරක්ෂිතතාව ද අත්‍යවශ්‍ය සාධකයකි. බෞද්ධ මූලාශ්‍රයට අනුව ආර්ථික සුරක්ෂිතතාව පිණිස පුද්ගලයා දුරාචාරයන්ගෙන් වෙන්ව,
(1) අඹුදරුවන් පෝෂණය කළ යුතු ය. (2) අනලස්ව කටයුතු කළ යුතු ය.
(3) දැහැමිව ධනය ඉපයිය යුතු ය. (4) පංච බලි දිය යුතු ය.
(5) තමා මෙන් ම අනුන් ද පිනවිය යුතු ය.

[හතරවැනි පිටුව බලන්න.

**23.** භික්ෂු භික්ෂුණීන්ගේ ශරීරකෘත්‍ය පහසුවෙන් සිදු කර ගැනීම සඳහා වැසිකිළි කැසිකිළි අනුදත් බුදුරදුන් ඊට අදාළ ඇවතුම් පැවතුම් රැසක් ද වච්චකුටිවත්ත මගින් අනුදත් සේක. හරිත තණ බිම්වල මෙන් ම ජලයේ ද මල මූත්‍රා නො කළ යුතුය, යන්න තවත් එක් විනය නීතියකි. එම විනය නීතිය පැනවීම මගින් ප්‍රකට වන්නේ බුදුරදුන්,
(1) මහජන හඬට කන්දුන් බවයි.
(2) පරිසර සංරක්ෂණය පිළිබඳ සැලකිලිමත් වූ බවයි.
(3) භික්ෂූන්ගේ විනය පිළිබඳ අවධානයෙන් සිටි බවයි.
(4) අන්‍යාගමික අදහස්වලට ගරු කළ බවයි.
(5) භික්ෂූන්ගේ ශරීරකෘත්‍ය පිළිබඳ සැලකිලිමත් වූ බවයි.

**24.** බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය මෙන් ම නිර්මාණාත්මක සෞන්දර්යය ද අගය කොට ඇති අවස්ථා පෙළ දහමෙන් හමු වේ. මෙකී උභය සෞන්දර්යය අතර නිර්මාණාත්මක සෞන්දර්යය උත්පාදනය කරන මාධ්‍යයක් ලෙස සැලකිය හැක්කේ,
(1) ගංගා, ඇළ දොළ ය. (2) බෞද්ධ ස්තූප ය. (3) වන සතුන් ය.
(4) මහවනය ය. (5) මේඝය ය.

**25.** බුදුසමයට අනුව රාජ්‍යය පියපුතු උරුමයෙන් හෝ දේව වරමින් ලද්දක් නො වේ. දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය මහජන සම්මුතියෙන් පාලකයා පත් වූ බවත්, ඔහු 'රාජා' යන අපර නාමයකින් හැඳින්වූ බවත් සඳහන් කරයි. මෙහිලා 'රාජා' යන්න භාවිතයට පැමිණියේ පාලකයා,
(1) ගැරහිය යුත්තන්ට ගරහා පාලනය කරන්නකු වූ බැවිණි.
(2) හෙලා දැකිය යුත්තන් හෙලා දැක පාලනය කරන්නකු වූ බැවිණි.
(3) නෙරපිය යුත්තන් නෙරපා පාලනය කරන්නකු වූ බැවිණි.
(4) කෙත්වතු ආරක්ෂා කොට පාලනය කරන්නකු වූ බැවිණි.
(5) ජනතාව සතුටු කොට පාලනය කරන්නකු වූ බැවිණි.

**26.** නව අරහාදී බුදුගුණ සහ බුද්ධ චරිතය පුරා විහිදී පවත්නා අනෙකුත් විශිෂ්ට ලක්ෂණවලින් බුද්ධ චරිතයේ ශ්‍රේෂ්ඨත්වය හඳුනාගත හැකිය. බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය ද බුද්ධ චරිතයේ සුවිශේෂ ලක්ෂණයක් වන අතර එය වඩාත් නිවැරදි ව ප්‍රකාශ වන්නේ,
(1) යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී බවෙනි. (2) තිලෝගුරු නමින් හැඳින්වීමෙනි.
(3) උපායකෞශල්‍යයෙන් දහම් දෙසීමෙනි. (4) සත්ථා දේවමනුස්සානං යන බුදුගුණයෙනි.
(5) තාදී ගුණයෙනි.

**27.** බුදුරජාණන් වහන්සේ තුළ පැවති අසාමාන්‍ය ප්‍රඥාව, මහා ප්‍රඥාව නමින් හැඳින්වෙන අතර එය,
(1) අගතිගාමී නොවී සමානාත්මතාවෙන් යුක්ත ව කටයුතු කිරීමෙන් පැහැදිලි වේ.
(2) අනුගාමිකයන්ගේ දක්ෂතා හා ප්‍රවීණතා අගය කිරීම තුළින් පැහැදිලි වේ.
(3) ගැටලු විසඳීම හා ප්‍රශ්නවලට පිළිතුරුදීම ආදියෙන් පැහැදිලි වේ.
(4) අධර්ම චර්යා හේතුවෙන් සසර දුකට පත්වූවන් ඉන් මුදවා ගැනීමට උත්සුක වීමෙන් පැහැදිලි වේ.
(5) "මෙම ධර්මය ප්‍රඥාවන්තයන් සඳහා මිස ප්‍රඥාව නැති අය සඳහා නො වේ" යයි දේශනා කිරීමෙන් පැහැදිලි වේ.

**28.** "භවත්නි, මහණගොයුම්හු සිල්වත් වූහ. පහ වූ කාමරාග ඇත්තේය. බොහෝදෙනාට ආචාර්ය වූයේ ය. දහස් ගණන් දෙවිබඹහු දිවි හිමියෙන් සරණ ගියහ" යනුවෙන් සෝණදණ්ඩ බමුණා විසින් කරන ලද ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ ආගමික සහනශීලීතාවයි.
(2) බුදුරාජාණන් වහන්සේගේ මහා ප්‍රඥාවයි.
(3) බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවයි.
(4) බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන්ට ගුරුවරයකු වූ බවයි.
(5) බුදුරජාණන් වහන්සේ පිළිබඳ තත්කාලීන ඇගයීමයි.

**29.** බහු ආගමික සමාජයක් තුළ සිය ආගමික අනන්‍යතාව රැක ගනිමින් ආගමික සහජීවනයෙන් යුතුව ජීවත්වීමට බුද්ධ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ බොහෝ ය. බුදු සිරිතේ තවත් සුවිශේෂ ලක්ෂණයක් වූ එය,
(1) තථාගතයන් වහන්සේ වුව ද විමංසනය කොට බැලිය යුතු යයි දේශනා කිරීමෙන් පැහැදිලි වේ.
(2) කාලාමවරුන්ට ස්වාධීන ව සිතාමතා කටයුතු කරන්න යයි උපදෙස් දීමෙන් පැහැදිලි වේ.
(3) බුදුරදුන් චූලසකුළුදායි පිරිවැජියාගේ ආශ්‍රමයට වැඩම වීමෙන් පැහැදිලි වේ.
(4) කසීභාරද්වාජ බ්‍රාහ්මණයා සීසාන ස්ථානයට පිඬුසිඟා යාමෙන් පැහැදිලි වේ.
(5) රාධ බමුණා උපසපන් කිරීමට නියම කිරීමෙන් පැහැදිලි වේ.

**30.** සාමණේර භික්ෂූන්ට මුල්කාලයේ කිසිදු ශික්ෂාපදයක් පනවා නො තිබුණ අතර පසු කාලීනව දශ ශික්ෂාවන් ආරක්ෂා කිරීමට නියම කරන ලදී. මෙසේ ශික්ෂාවන් පනවන ලද්දේ,
(1) සැරියුත් මහරහතන් වහන්සේගේ ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙනි.
(2) මුගලන් මහරහතන් වහන්සේගේ ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙනි.
(3) සුද්ධෝදන රජතුමාගේ ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙනි.
(4) කොසොල් රජතුමාගේ ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙනි.
(5) සාමණේර භික්ෂූන් විසින් ම කරන ලද විමසීමකට ප්‍රතිචාරයක් වශයෙනි.

[පස්වෙනි පිටුව බලන්න.

**31.** වස්සාවාසයේ ආරම්භය අන්‍යාසාමයික ආභාසය සහිත ව සිදුවිය. වස්විසීම හා බැඳුණු නීතිරීති හා සීමා නියමයන් විනය පිටකයෙහි පැහැදිලි කොට ඇත. ඒ අනුව උපසපන් භික්ෂූන් විනයානුකූල ව පෙරවස් එළඹිය යුත්තේ,
(1) ඇසළ අවපැලවිය දින ය. (2) ඇසළ පුර පැලවිය දින ය.
(3) බිනර පුර පැලවිය දින ය. (4) බිනර අවපැලවිය දින ය.
(5) වප් පුර පැලවිය දින ය.

**32.** "බොහෝ ජනයාගේ හිතසුව පිණිස චාරිකාවේ හැසිරෙන්න" යයි සිය ශ්‍රාවකයන්ට උපදෙස් දී බුදුරජාණන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩම කළහ. උන්වහන්සේ එසේ වැඩම කෙළේ,
(1) උරුවෙල් කාශ්‍යපගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(2) විවේක සුවයෙන් වැඩ සිටීමේ අරමුණෙනි.
(3) යථාවාදී තථාකාරී ගුණයෙන් යුතුව කටයුතු කළ බැවිනි.
(4) ධ්‍යාන සමාපත්තියට සමවැදීමේ අරමුණෙනි.
(5) උරුවෙල් වැසියන්ගේ ආරාධනයකට ප්‍රතිචාරයක් වශයෙනි.

**33.** විමුක්තිය සොයා ගිය උපතිස්ස පිරිවැජියාට, දැමුණු ඉඳුරන් ඇති, ප්‍රසන්න පෙනුමැති, සන්සුන් ගමනින් වඩින අස්සජි තෙරුන් මුණ ගැසිණි. එහිදී උපතිස්ස පිරිවැජියාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන අස්සජි තෙරහු යම් ධර්ම පර්යායක් දේශනා කරමින් උපතිස්ස පිරිවැජියාට විමුක්තිය පිණිස මග පෙන්වූහ. එහි දී අස්සජි තෙරුන් විසින් දේශනා කරන ලද්දේ,
(1) චතුරාර්ය සත්‍යය පිළිබඳ ධර්මයකි. (2) ත්‍රිලක්ෂණය පිළිබඳ ධර්මයකි.
(3) ත්‍රිවිධ ශික්ෂාව පිළිබඳ ධර්මයකි. (4) පටිච්චසමුප්පාදය පිළිබඳ ධර්මයකි.
(5) නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිබඳ ධර්මයකි.

**34.** භාරතීය ශාසන ඉතිහාසය තුළ ථෙරවාදීන්ගේ මූලිකත්වයෙන් ධර්ම සංගායනා තුනක් පැවැත් වූ බව පාලි මූලාශ්‍රයවලින් මෙන් ම වෙනත් විවිධ මූලාශ්‍රයවලින් පැහැදිලි වේ. සංගායනා ඉතිහාසයට අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) පළමු සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස නිකාය භේදය ආරම්භ විය, යන්නයි.
(2) දෙවන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් ලෙස හැට දහසක් දුසිල් චීවරධාරීන් සසුනෙන් නෙරපන ලදී, යන්නයි.
(3) දෙවන සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස බුද්ධ දේශිත ධර්මය වර්ගීකරණය කොට භාණක පරම්පරා මාර්ගයෙන් පවත්වා ගෙන යාමට භාර කරන ලදී, යන්නයි.
(4) තෙවන සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස පරවාද ඛණ්ඩනය කරමින් සකවාද තහවුරු කොට කථාවත්ථුප්පකරණය රචනා කරන ලදී, යන්නයි.
(5) තෙවන සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස දස දහසක් භික්ෂූන් වෙන් ව ගොස් වෙන ම නිකායක් පිහිටුවා ගන්නා ලදී, යන්නයි.

**35.** සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ දක්ෂතා හඳුනාගත් බුදුරජාණන් වහන්සේ ඔවුන්ට සුදුසු විවිධ ශාසනික තනතුරු පිරි නැමූහ. එසේ ශාසනික තනතුරු පිරිනමන ලද්දේ,
(1) බිම්බිසාර රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(2) බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිපත්තියක් වූ බැවිනි.
(3) අන්‍ය ආගමිකනායකයන් ද එවැනි තනතුරු පිරිනමා තිබූ බැවිනි.
(4) මහජනයාගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(5) භික්ෂූන් විසින් තනතුරු ඉල්ලා සිටි බැවිනි.

**36.** නාලන්දා විශ්වවිද්‍යාලය වනාහි පැරණි භාරතයේ පැවති කීර්තිමත් ම අධ්‍යාපන ආයතනයයි. ඉතා දියුණු හා ක්‍රමවත් අධ්‍යාපන හා පරිපාලන රටාවක් පැවති මෙම විශ්වවිද්‍යාලයේ විවිධ වගකීම් හා බැඳුණු තනතුරු ද පැවැතිණි. 'ද්වාර පණ්ඩිත' යනුවෙන් දැක්වෙන්නේ එවැනි තනතුරකි. එම නමින් අර්ථවත් වූයේ,
(1) විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ හා පිටවීමේ දොරටු භාරව සිටි ප්‍රධාන භික්ෂු නිලධාරියා ය.
(2) පුස්තකාලය භාරව සිටි ප්‍රධාන භික්ෂු නිලධාරියා ය.
(3) පරිපාලනය භාරව සිටි ප්‍රධාන භික්ෂු නිලධාරියා ය.
(4) සිසුන් බඳවා ගැනීමේ මණ්ඩලයේ ප්‍රධාන තනතුර දැරූ භික්ෂු නිලධාරියා ය.
(5) විශ්වවිද්‍යාලයේ කුලපති තනතුර දැරූ භික්ෂු නිලධාරියා ය.

**37.** කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේ පැවති සිවුවන ධර්ම සංගායනාවට රාජ්‍යානුග්‍රහය දක්වන ලද්දේ,
(1) පුෂ්‍යමිත්‍ර රජු විසිනි. (2) කණිෂ්ක රජු විසිනි. (3) හුවිෂ්ක රජු විසිනි.
(4) මිළිඳු රජු විසිනි. (5) ශක්‍රාදිත්‍ය රජු විසිනි.

**38.** ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලංකාවේ විවිධ ආගමික විශ්වාසයන් පැවති බවත්, පණ්ඩුකාභය රජතුමා ඒවා විෂයයෙහි අනුග්‍රහ දැක්වූ බවත් පැරණි මූලාශ්‍රයන්හි දැක්වේ. එම වාර්තාවලට අනුව බටහිර වාහල්කඩ අසල නුග ගසක් වාසභවනය ලෙස වෙන් කරන ලද්දේ,
(1) වෛශ්‍රවණට ය. (2) ව්‍යාධ දෙවියාට ය. (3) කම්මාර දෙවියාට ය.
(4) චිත්තරාජ යක්ෂයාට ය. (5) කාලවේල යක්ෂයාට ය.

**39.** මහාවිහාරය ශ්‍රී ලංකාවේ ථේරවාද බෞද්ධ මධ්‍යස්ථානයයි. ජාත්‍යාගමික වශයෙන් මහා විහාරයෙන් සිදු වූ මෙහෙය අතිවිශාල ය. ථේරවාදී ත්‍රිපිටක සාහිත්‍යය සංවර්ධනය කිරීම මෙහිලා ප්‍රමුඛ වේ. තවද ථේරවාදී ත්‍රිපිටකය සඳහා අර්ථකථන සම්පාදනය දේශීය හා විදේශීය භික්ෂූන් අතින් සිදු වූ මහඟු කාර්යභාරයකි. මේ සඳහා මූලිකත්වයක් ගත් විදේශීය භික්ෂුවක් ලෙස,
(1) මහාසුමන තෙරුන් ප්‍රකට ය. (2) මහා පදුම තෙරුන් ප්‍රකට ය.
(3) චූලාභය තෙරුන් ප්‍රකට ය. (4) චූලනාග තෙරුන් ප්‍රකට ය.
(5) ධම්මපාල තෙරුන් ප්‍රකට ය.

[හයවැනි පිටුව බලන්න.

**40.** ඉපැරණි ශ්‍රී ලංකාවේ, ආරාම කේන්ද්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස ප්‍රකට අෂ්ටමූලායතනවලින් සමහරක් මහාවිහාරයට අනුබද්ධ වූ අතර සමහරක් අභයගිරියට අනුබද්ධ විය. ඒ අනුව විජයබා රජු විසින් අභයගිරියට අනුබද්ධිත ව පිහිටුවන ලද මූලායතනයක් ලෙස සැලකෙන්නේ,
(1) විල්ගම් මූලයයි. (2) කපාර මූලයයි. (3) දක්ෂිණ මූලයයි.
(4) උත්තර මූලයයි. (5) මහනෙත්පා මූලයයි.

**41.** බෞද්ධ දේශපාලන මූලධර්ම අනුව පාලකයා මහජන මතයට ගරු කළ යුතුය. මෙම ඉගැන්වීමට අනුගත ව ශ්‍රී ලාංකේය පාලකයන් ද අතීතයේ කටයුතු කර ඇති අයුරු ඓතිහාසික තොරතුරුවලින් හෙළි වේ. විනාශ කරන ලද මහාවිහාරය නැවත ගොඩනැගීම ද එවැනි එක් අවස්ථාවකට උදාහරණයකි. ඊට මැදිහත් වූ පාලකයා වූයේ,
(1) ගෝඨාභය රජු ය. (2) මහසෙන් රජු ය. (3) ජෙට්ඨතිස්ස රජු ය.
(4) ධාතුසේන රජු ය. (5) වලගම්බා රජු ය.

**42.** වසර දහයක පමණ කාලයක් ශ්‍රී ලංකාවේ දී ධර්ම විනය උගෙන බුරුමයට ගොස් 'සීහලසංඝ' නමින් නිකායක් බිහිකොට බුරුම බුදු සමයේ පෝෂණයට කටයුතු කළ ඡප්පට හිමියන් ශ්‍රී ලංකාවට පැමිණියේ,
(1) අනව්රථ රජ සමයේ ය. (2) ධම්මචේතිය රජ සමයේ ය. (3) බෝදව්පයා රජ සමයේ ය.
(4) මින්ඩොං රජ සමයේ ය. (5) කෙයංසිත්ථ රජ සමයේ ය.

**43.** ක්‍රි.ව. හත්වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බව සුප්‍රසිද්ධ චීන සංචාරක හිමිනමක වූ හියුංසියෑං වාර්තා කොට ඇත. මෙයින් අදහස් වන්නේ,
(1) ජපානයේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බවයි.
(2) චීනයේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බවයි.
(3) බුරුමයේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බවයි.
(4) ඉන්දියාවේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බවයි.
(5) ථායිලන්තයේ බුදු සමය සමෘද්ධිමත් ව පැවති බවයි.

**44.** භාරතය තුළ බෞද්ධ ග්‍රන්ථ විනාශ වී බුදු සමය නැති වී යද්දී මහායාන බෞද්ධ ධර්ම ග්‍රන්ථ විශාල ප්‍රමාණයකුත් හීනයාන ගුරු කුලවලට අයත් ඇතැම් ධර්ම විනය ග්‍රන්ථත් පරිවර්තනය කොට සංරක්ෂණය සඳහා කටයුතු කළ රට වන්නේ,
(1) චීනයයි. (2) ථායිලන්තයයි. (3) ජපානයයි. (4) ශ්‍රී ලංකාවයි. (5) බුරුමයයි.

**45.** "ත්‍රිවිධ රත්නයට සියලු දෙනා ම ගරු කළ යුතුයි" යනුවෙන් ප්‍රකාශයට පත්කොට රාජ්‍ය ව්‍යවස්ථාවකින් බුදු දහම ජපානය තුළ නිල වශයෙන් පිළිගෙන රාජ්‍ය ආගම බවට පත් කෙළේ,
(1) කිම්මෙයි අධිරාජයා විසිනි. (2) යෝමෙයි අධිරාජයා විසිනි.
(3) ෂෝතොකු කුමරු විසිනි. (4) ෂෝමු අධිරාජයා විසිනි.
(5) කම්මු අධිරාජයා විසිනි.

**46.** 'නර දයිබුත්සු' (Nara Daibutsu) යනු,
(1) ජපන් බුද්ධ ප්‍රතිමාවකි. (2) ජපන් බෞද්ධ උත්සවයකි.
(3) ජපන් බෞද්ධ මල් කලාවකි. (4) ජපන් බෞද්ධ නාට්‍යයකි.
(5) ජපන් බෞද්ධ නායකයෙකි.

**47.** බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ පහක් ගතවන තුරුත් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය නො කරන ලද බව පුරාවිද්‍යාත්මක මතයයි. එහෙත් බුදුරදුන් ජීවමාන කාලයේ ම ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද බුද්ධ ප්‍රතිමාවක් පිළිබඳ මූලාශ්‍රයක සඳහන් වේ. එම මූලාශ්‍රය වනුයේ,
(1) මනෝරථපූරණියයි. (2) මිළින්ද ප්‍රශ්නයයි. (3) මහා වංශයයි.
(4) කෝසල බිම්බ වර්ණනාවයි. (5) සමන්තපාසාදිකාවයි.

**48.** "ආනන්දයෙනි, ස්තූපකොට පුදනු ලබන්නට සුදුසු පුද්ගලයෝ සතරදෙනකි. කවර සතර දෙනෙක් ද යත් අර්හත් සම්‍යක් සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත හා සක්විති රජු යනුවෙනි." මෙම ප්‍රකාශය ඇතුළත් සූත්‍රය වනුයේ,
(1) දීඝනිකායේ මහාපදාන සූත්‍රයයි. (2) දීඝනිකායේ මහානිදාන සූත්‍රයයි.
(3) දීඝනිකායේ මහාසතිපට්ඨාන සූත්‍රයයි. (4) දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රයයි.
(5) දීඝනිකායේ මහාසුදස්සන සූත්‍රයයි.

**49.** ලක්දිව හිටි පිළිමවල ප්‍රකට ව දක්නට ලැබෙන මුද්‍රා ක්‍රමය වන්නේ,
(1) අභය මුද්‍රාවයි. (2) වරද මුද්‍රාවයි. (3) ධර්මචක්‍ර මුද්‍රාවයි.
(4) විතර්ක මුද්‍රාවයි. (5) පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාවයි.

**50.** ශ්‍රී ලාංකික කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යය ප්‍රකට කෙරෙන සඳකඩපහණේ අන්තර්ගත විවිධ සංකේතයන්ගෙන් විවිධ අරුත් නිරූපණයවන බව වියතුන් විසින් පෙන්වා දී තිබේ. මේ අතර සමස්ත සඳකඩපහණ පිළිබඳ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය වන්නේ ඉන්,
(1) නිර්වාණය සංකේතවත් කරන බවයි. (2) සිවුදිශාව නිරූපණය කරන බවයි.
(3) සෞභාග්‍යය සංකේතවත් කරන බවයි. (4) සංසාර චක්‍රය නිරූපණය කරන බවයි.
(5) සිවුදිශාවෙන් පැමිණෙන සියලු දෙනාට විවෘත වූ ස්ථානයක් හඟවන බවයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) චතුර්වර්ණ නිර්මාණයේ දී ක්ෂත්‍රිය වර්ණයට නියම කරනු ලැබූ 'ස්වධර්මය' නිවැරදි ව නම් කරන්න.
   (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන 'ආපද්ධර්ම' හඳුන්වා දෙන්න.
   (iii) බ්‍රාහ්මණ ආගමික සම්ප්‍රදාය තුළ කාන්තාව පුරුෂාධිපත්‍යයට යටත්කොට පාලනය කළ බවට සාධක **තුනක්** ගෙනහැර දක්වන්න.
   (iv) සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් හඳුන්වන්න.
   (v) ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ මගධ රාජ්‍යයේ පැවති පරිපාලන ව්‍යුහය හඳුන්වා දෙන්න.

2. (i) බෞද්ධ මූලාශ්‍රයනට අනුව බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය කෙසේ සිදුවීදැයි පහදා දෙන්න.
   (ii) බුද්ධකාලීන භාරතයේ පැවති, පුද්ගලයාගේ ස්වාධීනත්වයට බාධා පැමිණ වූ ආගමික ඉගැන්වීම් **දෙකක්** හඳුන්වා දෙන්න.
   (iii) සප්ත අපරිහානීය ධර්ම නිවැරදි ව නම් කරන්න.
   (iv) සතර සංග්‍රහවස්තුවලට අයත් 'ප්‍රියවචනය' පිළිබඳ ධර්මානුකූල විවරණයක් සපයන්න.
   (v) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් 'උඩ දිසාවෙන්' නියෝජනය වන සමාජ සංස්ථාවට අයත් යුතුකම් හා වගකීම් පෙන්වා දෙන්න.

3. (i) 'භික්ඛු සංඝ' හා 'සාවක සංඝ' අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
   (ii) පරාභව සූත්‍රයට අනුව පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු **අටක්** නම් කරන්න.
   (iii) දස පින්කිරියවත් නම්කොට 'වෙය්‍යාවච්ච' යන්න කෙටියෙන් හඳුන්වන්න.
   (iv) බුදුසමය තුළ 'අමූලිකා ශ්‍රද්ධාවට' හිමි තැන පහදන්න.
   (v) පුද්ගල අසහනය වර්ධනය වීමට 'මහිච්ඡතාව' හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

## II කොටස

4. (i) බුද්ධචරිතයෙන් ප්‍රකටවන කාල කළමනාකරණ ලක්ෂණ පුද්ගල ජීවිතයක සාර්ථකත්වයට උපයෝගී කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
   (ii) ස්වභාව සෞන්දර්යය පිළිබඳ රහතන් වහන්සේලාගේ ඇගයීම නිදසුන් **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න.
   (iii) නිර්මාණාත්මක සෞන්දර්යය බිහිවීම විෂයයෙහි දැහැමි විවේකය පාදක වී ඇති ආකාරය පෙන්වා දෙන්න.
   (iv) බුදුදහමේ උගන්වන 'ප්‍රඥාව' සැකෙවින් හඳුන්වන්න.

5. (i) 'වෙළඳාම', ධාර්මික ජීවනෝපායයක් වන්නේ කෙසේදැයි බෞද්ධ නිර්ණායකවලට අනුව විවරණය කරන්න.
   (ii) 'දරිද්‍රතාව', ජයගත හැකි සමාජ ප්‍රශ්නයක් බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සනාථ කරන්න.
   (iii) ධනය වනාහී රැස්කොට තබා ගත යුත්තක් නොව සංසරණය විය යුත්තක් බව සහේතුක ව පෙන්වා දෙන්න.
   (iv) සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සැකෙවින් ගෙනහැර දක්වන්න.

[ දෙවැනි පිටුව බලන්න.

**6.** (i) බුද්ධචරිතයෙන් ප්‍රකට වන 'කෘතවේදී ගුණය' නූතන සමාජයේ අභිවෘද්ධියට උපයෝගීකොට ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ii) දුකටපත් ජනතාවට පිහිටවීමට ඇපකැප වීමෙහිලා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයෙන් ලැබිය හැකි ආලෝකය පැහැදිලි කරන්න.

(iii) බුදුරදුන් තුළ පැවති අවස්ථාවෝචිත ව කටයුතු කිරීමේ ගුණයෙන් වර්තමාන සමාජයට ලබා ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

(iv) "බුදුසමයෙහි දැක්වෙන නිදහස් චින්තනය වගකීමෙන් තොර වූවක් නො වේ." සාකච්ඡා කරන්න.

**7.** (i) බුද්ධකාලීන ධර්ම ප්‍රචාරක සේවාවේ සාර්ථකත්වය උදෙසා ශ්‍රාවක සංඝයාගෙන් ඉටු වූ මෙහෙය අගය කරන්න.

(ii) 'ධර්ම සංගායනාවක්' යනු කුමක් දැයි හඳුන්වා ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ මූලාශ්‍රයාගත තොරතුරු කෙටියෙන් දක්වන්න.

(iii) බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා කණිෂ්ක රජුගෙන් ඉටු වූ සේවය අගයන්න.

(iv) ශ්‍රී ලාංකික රජදරුවන්ගේ ආධ්‍යාත්මය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ආකාරය නිදසුන් දක්වමින් ප්‍රකට කරන්න.

**8.** (i) 'ථායි' ජනජීවිතයට බුදුසමයෙන් ලැබුණු ආලෝකය ගෙනහැර දක්වන්න.

(ii) බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වීමට පෙර බුදුරදුන් නියෝජනය කිරීමට යොදාගත් සංකේත නිදසුන් මඟින් ප්‍රකට කරන්න.

(iii) බෞද්ධ සාරධර්ම සමාජගත කිරීමට චිත්‍ර කලාව ප්‍රබල මාධ්‍යයක් වී ඇති ආකාරය පෙන්වා දෙන්න.

(iv) ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ පෝෂණයට බුදුසමයෙන් ලැබුණු ආභාසය සනිදර්ශන ව ගෙනහැර දක්වන්න.

* * *